## විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| ස්ථානය | :- | රඹුක්කන ප්‍රාදේශීය සභාව |
| දිනය | :- | 2025.12.15 |
| වේලාව | :- | පෙ.ව. 9.30 |

## සහභාගිත්වය

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
4. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
5. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
6. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
7. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
8. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
9. කේ.සී.සරත් කුමාර මැතිතුමා
10. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
11. ජේ.පී.පද්මසිරි මැතිතුමා
12. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
13. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
14. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
15. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
16. ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
17. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
18. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
19. වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
20. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
21. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
22. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
23. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
24. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
25. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
26. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
27. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
28. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
29. එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය
30. ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා
31. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා

## නිලධාරී සහාභාගිත්වය

❖ ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

## ආගම සිහිකිරීම

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අද දින විශේෂ මහා සභාවක් කැඳවීමට ප්‍රධානතම අරමුණ වූයේ පසුගිය සුළි කුණාටුව හේතුවෙන් අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විපතට පත් ජනතාව වෙනුවෙන් සහන සැලසීම සම්බන්ධ කටයුතු කිරීමට පවතින රජය විසින් අප සභාව වෙත මිලියන 05 ක මුදලක් ලබා දුන් බවත්, එම මුදලින්

- ආපදාවට පත් ජනතාව කඳවුරු ගත කිරීම හා නඩත්තුව
- අනතුරුදායක ගස් ඉවත් කිරීම
- අවහිර වූ මාර්ග යථා තත්ත්වයට පත් කිරීම
- වැසිකිළි වළවල් පිරිපහදු කිරීම ආදීය සිදු කිරීම සඳහා

2025 නොවැම්බර් මස 23 දින වන විට මෙම සුළි සුළඟින් බොහෝ අනතුරු සිදුවීම ආරම්භ වූ බවත්, මෙවැනි ව්‍යසනකාරී තත්ත්වයකට එතුමා පළමු වතාවට සභාවක් හැටියට මුහුණ දුන් බවත්, සභාව සතු යන්ත්‍ර සූත්‍ර හා සේවක මහත්ම මහත්මීන් හා නිලධාරි මහත්ම මහත්මීන් මන්ත්‍රීතුමන්ලා හා තුමියන්ලා ඒකරාශී කරගෙන මෙම ව්‍යසනයට සාර්ථකව මුහුණ දුන් බවත්, එදින සිට පසුගිය දෙසැම්බර් 14 වන දිනය දක්වා කාර්යයන් 31 ක් සිදුකළ බවත්, එම එක් එක් කාර්ය සම්බන්ධ අදාල කොට්ඨාසේ මන්ත්‍රීතුමන් විසින් පැහැදිලි කිරීමක් සිදුකරන ලෙසත් අදාළ කාර්ය සිදු කිරීම සම්බන්ධව මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම විශේෂ මහා සභාව කැඳවීමේ අරමුණ බවත් පැහැදිලි කරන ලදී.

01. ආපදා තත්වය හේතුවෙන් කරන ලද පිළිසකර කිරීම් වල ඇස්තමේන්තු හා බිල්පත් සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

1.1බැද්දවල ප්‍රදේශයේ තලගොල්ල මාර්ගයේ විශාල මාර ගසක් කඩා වැටීමෙන් කාන්තාවක් අනතුරට පත් වූ බවත්, විවිධ පාර්ශවයන් පැමිණ ඇය මුදවා ගැනීමට කටයුතු සිදු කළ ද එය සිදු කිරීමට අපොහොසත් වූ බවත්, සභාවක් හැටියට අප මැදිහත්වී සභාවේ බැකෝ යන්ත්‍රය භාවිතා කර එම කාන්තාව බේරාගත් බවත්, ඒ සඳහා පැය 03 වත් අධික කාලයක් ගත වූ බවත්, වියදම් ලෙස රු18,550.00 මුදලක් වැය වූ බවත්, එයට මහ සභා අනුමැතිය ලබා දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මෙම යෝජනාව අදාල කොට්ඨාශය භාර මන්ත්‍රීතුමන් විසින් යෝජනා කරන්නේද යන්න විමසන ලද අතර තලගොල්ල මාවනැල්ල ප්‍රදේශයට අයත් බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

අයහපත් කාලගුණයත් සමඟ තලගොල්ල වසමේ මාර ගසක් කඩාගෙන වැටුණු බවත්, එහිදී පොඩි දරුවකු හා සීයා බේරා ගැනීමට හැකි වූ බවත් තවත් කාන්තාවක් එහි සිටි බැවින් ඇය මුදවා ගැනීමට පංගු බේදයකින් තොරව සභාවක් හැටියට අප කටයුතු කළ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මුළු රටක් පීඩාවට පත්ව සිටින මොහොතක විපක්ෂයේ ජොෂ්ඨ යැයි උදම් නගන මන්ත්‍රීතුමන්ගේ විහිළු සහගත හා ආත්මාර්ථකාමී අදහස් ගැන කණගාටු වන බවත්, රජයක් වශයෙන් අපේ සභාව නියෝජනය කරන්නේ සමස්ථ මහජනතාව වෙනුවෙන් බවත්, අනතුරක් සිදුව ඇති මොහොතක පිල් බෙදීමකින් තොරව සහයෝගයෙන් කටයුතු සිදු කළ යුතු බවත්, මහජන මුදල් අවභාවිතා නොකරන බවත්, නන්දික බණ්ඩාරනායක මන්ත්‍රීතුමා, ප්‍රියංජීත් මන්ත්‍රීතුමා වැනි මන්ත්‍රීතුමන්ලාට හිස නමා ආචාර කරන බවත්, සමඟි ජන බලවේගය හැර අනෙකුත් සියලුම මන්ත්‍රීවරුන් මෙම ව්‍යසන අවස්ථාවේ අප සමඟ සිටි බවත්, ගියවර ප්‍රකාශ කළ පරිදි රාත්‍රී 9 ට පමණ සභාවේ රියදුරු මහතා මහ වැසි නොතකා සැතපුමක් පමණ පා ගමනින්ම පැමිණ අලුයම 3 පමණ වෙනකම්ම කැපවීමෙන් කටයුතු කර බවත්, තලගොල්ල අපට අයත් නොවුනත්

ජීවිතයක් බේරා ගැනීමට හැකිවීම අප ලද ගෞරවයක් බවත්, කවුරුන් හෝ උදව්වක් ඉල්ලූ විට එයට පිටුපෑමට තරම් කුහක නොවන ලෙසත්, තෙන්නකෝන් මන්ත්‍රීතුමා මෙම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට එකඟ නොවේ නම් මෙම සේවාව සභාවක් හැටියට නොමිලයේ සිදුකිරීමට අවසර ලබාදෙන ලෙස යෝජනා කරන ලදී.

- ❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

තමාට අපහාස නොකරන ලෙසත් මහජනතාවට සේවය කිරීම සුදුසු බවත්, නමුත් රඹුක්කන ජනතාවට ලබාදීමට වෙන් වූ පළාත් සභා මුදලක් වෙනත් බල ප්‍රදේශයකට ලබාදීම සුදුසු නොමැති බවත්, මහජන මුදල් ආයතා ලෙස භාවිතා නොකළ යුතු බවත්, තමාට අපහාසාත්මකව වචන භාවිතා කිරීම සුදුසු නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

- ❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

විශේෂ මහසභාවක් කැඳවූ විට මෙවැනි විවාදාත්මක සාකච්ඡාවක් සිදුවේ යැයි අපේක්ෂා නොකළ බවත්, මාවනැල්ල ප්‍රාදේශීය සභාව මේ ගැටලුව සම්බන්ධව මැදිහත් වූවා නම් අපට සභාවක් හැටියට මැදිහත්වීමට අවස්ථාවක් උදානොවන්නට තිබූ බවත්, පුද්ගලයින් වයසට යැමත් සමඟ පරිණත වන බවත්, සමහරු පතනරින් වන බවත්, වතුර ගලාගෙන යන විට එයට දේශ සීමා අදාළ නොවන බවත්, අණපනත් රීති පවතින්න පුළුවන් ඒවා ක්‍රියාත්මක කරන්නත් පුළුවන් උල්ලංඝනය කරන්නත් පුළුවන් මෙම අණ පනත් රීති පමණක් ප්‍රමාණවත් නොමැති බවත්, සදාචාරය අවශ්‍යතාවය හා මානුෂික අවශ්‍යතාවය මත කටයුතු කරන බවත් ප්‍රකාශ කළ අතර සෑම යෝජනාවකටම විරුද්ධත්වයක් දක්වන්නේ නැතුව නිහඬව සිටිමින් හෝ විරුද්ධත්වය ප්‍රකාශ කර අනවශ්‍යය ලෙස කාලය අපතය නොයවා සභා කටයුතු ඉක්මනින් නිම කිරීමට අප සැමගේ සහයෝගය ලබාදීම සුදුසු බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

සභා ගර්භය ඝෝෂා

**සභාපතිතුමන් විසින් එය සමථයකට පත් කරන ලදී.**

- ❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

පළාත් සභාවෙන් මුදල් වෙන් කළේ ආපදාවට ලක් වූ මහජනතාවට සහන සැලසීමට බවත්, තම බල ප්‍රදේශයට පමණක් සීමා විය යුතු බව එහි අදහසක් නොමැති බවත් ,ආපදාවට ලක්වූ සැවොම ලාංකිකයෝ බවත්, තත්ත්වය තරාතිරම නොබලා ඔවුනට උදව් කළයුත බවත් ප්‍රකාශ කරන ලදී.

සභා ගර්භය ඝෝෂා

- ❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

ආපදාවට පත් වූ ප්‍රදේශ යථා තත්ත්වයට පත් කිරීමට අදාළව සිදුකරන ලද කාර්යන්ට දැරූ වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට අවශ්‍ය බවත්, ඒ සඳහා සභා අනුමැතිය අවශ්‍ය බවත්, මෙම යෝජනා සියල්ලටම විරුද්ධත්වය ඔබතුමන්ලා දක්වන්නේ නම් අනවශ්‍ය ලෙස කාලය නොගෙන සියල්ලටම විරුද්ධයි කියා ප්‍රකාශ කර මෙම යෝජනාව සම්මත කරගැනීමට ඉඩකඩ ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී. හිටපු ප්‍රාදේශීය සභා සභාපති ඇතුල හඳගම මහතා අත්තනෝමතිකව මහජන මුදල් සොරා ගත් බව අප හොඳාකාරවයෙන්ම දන්නා බවත්, තවද මෙම මුදල් අප සොරා නොගත් බවත්, එම නිසා කවදා හෝ දිනක විගණනයකට ලක් නොවන බවත්, පරිනත මන්ත්‍රීවරයකු ලෙස ඔබතුමන් සැමදාම සභාවට බාධා කළ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

- ❖ **ගරු උපසභාපති ඊ්.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

විශේෂ මහ සභාවක් කැඳවූයේ අනවශ්‍ය තර්ක ගොඩ නැගීමට නොවන බවත්, පළමු යෝජනාව සඳහාම මෙසේ කාලය අපතේ යැවීමෙන් අවශ්‍ය කාර්ය සිදුකිරීමට නොහැකි වන බවත්, මෙහි සඳහන් පරිදි ජීවිතයක්

බේරා ගැනීම සම්බන්ධව තෙන්නකෝන් මන්ත්‍රීතුමන්ගේ විරුද්ධත්වය අනිවාර්යයෙන්ම මාධ්‍යයට වාර්තා කළ යුතු බවත්, රීති 37 වගන්තියට අනුකූල නොවන බැවින් රීති 38 ට වගන්තිය යටතේ මෙම ටිකිරි බණ්ඩා තෙන්නකෝන් මැතිතුමා සභා කටයුතු සඳහා බාධා කරන බැවින් සභාගර්භයෙන් ඉවත් කරන මෙන් සභාපතිතුමන්ගෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මෙම ගැටලුව තවදුරටත් ඉදිරියට ගෙන යා යුතු නොවන බවත්, මෙම ගෙවීම් කටයුතු සිදුකිරීමේදී නීති හෝ රීති ප්‍රශ්නයක් මතුවේ යැයි මෙතුමා අපේක්ෂා කරන්නට ඇතැයි අපේක්ෂා කරන බවත්, දේශ සීමා නොතකා කටයුතු කිරීම සම්බන්ධව සතුටු වන බවත්, රීති හෝ නීති ගැටලුවක් නොමැති නම් මෙම කටයුත්තට පූර්ණ සහයෝගය ලබා දෙන බවත්, මහජනතාවට සේවය කිරීමට අප සැම පැමිණ ඇති බවත් පවසන ලදී.
එසේම මාවනැල්ල සභාවෙන් මෙම මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට හැකියාව පවතීද යන්න විමසන ලෙසත් ටිකිරි බණ්ඩා තෙන්නකෝන් මැතිතුමා සභා කටයුතු සඳහා බාධා කරන බැවින් සභාගර්භයෙන් ඉවත් කිරීමට උපසභාපතිතුමා විසින් කළ ප්‍රකාශය සුදුසු නොමැති බවත්, තවද දසනායක මැතිතුමා හිටපු ප්‍රාදේශීය සභා සභාපති අතුල හඳගම මැතිතුමා අත්තනෝමතික ලෙස මුදල් අවභාවිතා කළ බව ප්‍රකාශ කරන ලදී. ඒ සම්බන්ධව කිනම් හෝ සාධකයක් පවතී නම් සභාවට ඉදිරිපත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පවතින රජය විසින් මෙම ව්‍යසනකාරී අවස්ථාවේදී මහජන සුභසිද්ධි උදෙසා විශාල කාර්ය භාර්යක් සිදුකළ බව ප්‍රකාශ කළ අතර මාවනැල්ල සභාවෙන් මෙම මුදල ප්‍රතිපූර්ණය කිරීම අවශ්‍ය නොවන බවත් ප්‍රකාශ කරන ලදී.
තවද සුනාමි ව්‍යසනයෙන් විනාශ වූ දුම්රිය මාර්ග එකල රජය විසින් සකස් කිරීමට නොහැකිව සිටියදී පවතින රජය විසින් දින 52 ක් වැනි කෙටි කාලයකින් සකස් කළ බවත්, මෙම ව්‍යසනයේදී බුජ්ගොමුව දුම්රිය මාර්ගය රඹුක්කන දක්වා සතියක් ඇතුළත පිළිසකර කර දුම්රිය ගමනාගමන කටයුතු සිදු කිරීමට අවස්ථාව උදාකළ බවත්, කිනම් හෝ ව්‍යසනයකදී කටයුතු කළ යුතු අන්දම පිළිබඳව රෝහණ සහෝදරයා අපට උගන්වා ඇති බවත්, එම පන්නරයෙන් කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

තවද තමා මෙම සභාවේ සභාපති හැටියට සේවය කරන කාලය ඇතුළත ඕනෑම ව්‍යසනකාරී තත්ත්වයකදී අදාල බල ප්‍රදේශය පිළිබඳව තැකීමක් නොකරන බවත්, ඕනෑම ප්‍රදේශීයක ආපදාතත්වයදී තමාගේ සේවාව අවැසි බව දැන්වූවහොත් එය ඉටු කරන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. තවද ජනාධිපති අණ පරිදි ජනාපති ලේකම් විසින් අංක 2464/30 හා 2025.11.28 දිනැතිව නිකුත් කරන ලද රට පුරා හදිසි ආපදා තත්ත්වය සම්බන්ධ ගැසට් පත්‍රය අනුව කටයුතු කළ බව ප්‍රකාශ කරන ලදී. එසේම ගියවර මහ සභා අවස්ථාවේදී සහකාර කොමසාරිස්තුමා මෙම ව්‍යසනය සඳහා මිලියන 05 ක ප්‍රතිපාදනයක් ප්‍රමාණවත් ද යන්න දුරකථනයෙන් විමසූ අතර එය සභාවට ඉදිරිපත් කළ අතර ඒ සඳහා ඔබලාගේ එකඟත්වය ලැබුණු බවත්, මෙම ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන බවත්, එම නිසා එය වියදම් කිරීමට දේශසීමා නොමැති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

පළමුවෙන්ම ව්‍යසනයෙන් අනතුරට පත් වූ ජනතාව වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂයේ සාතිශය සංවේගය ප්‍රකාශ කරන බවත්, සභාපතිතුමා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා කණිෂ්ඨ කාර්ය මණ්ඩල සේවක මහත්ම මහත්මීන් මහ වැසි නොතකා ආපදාවන්ට ලක් වූ මහජනතාව වෙනුවෙන් කළ සේවාවට එක්සත් ජාතික පක්ෂය හද පිරි ප්‍රණාමය මේ අවස්ථාවේ පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී. ඉන් අනතුරුව ජනාධිපතිතුමන්ගේ අණ පරිදි ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද ගැසට් පත්‍රය සභාව පටන් ගත් මොහොතේ ඉදිරිපත් කළා නම් ඉහත පරිදි ගැටලුවක් පැන නොගනින බවත්, අදාල යෝජනාව වෙන් වෙන්ව විවාදයට ගැනීම අවශ්‍ය නොවන බවත් ප්‍රකාශ කරන ලදී. ගැටලුවක් පැන නගින්නේ සභා අරමුදල් වියදම් කිරීමේදී බවත් විගණනයට ලක්වන ලෙස කටයුතු නොකළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

අංක 01 -බැද්දවල කොට්ඨාශයේ සිදුවීමත්,
අංක 03 -කුඩාගම කොට්ඨාශයේ දොඹේමඩ ප්‍රධාන මාර්ගයත්,
අංක 05 -ගබ්බල රඹුක්කන කුරුණෑගල ප්‍රධාන මාර්ගයත්,
අංක 07 -ගබ්බල රඹුක්කන කටුපිටිය ප්‍රධාන මාර්ගයත්,
අංක 21 -කඩිගමුව උඩුගම මාර්ගයත්,

මෙම ව්‍යාපෘති පහට අදාළ මාර්ග වෙනත් ආයතන මගින් නඩත්තු වන බැවින් එම ආයතන වලටද මෙම මුදල් වෙන් වී ඇති බැවින් අදාළ ව්‍යාපෘති සඳහා දැරූ වියදම් එම ආයතන මගින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සුදුසු බවත්, එවිට ඉදිරියේදී විගණනයකට භාජනය නොවීමට හැකියාව පවතින බවත් ප්‍රකාශ කරන ලදී. තවද අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් ඒවා බවත්, එම ගෙවීම් සිදු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.ටී.එන්.ප්‍රසන්න මැතිතුමා**

පසුගිය ව්‍යසන අවස්ථාවේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් සියලු දෙනා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එක් වී සැහෙන වැඩ කොටසක් සිදුකළ බවත්, ඒ වගේම මංගලගම, මොළගොඩ ප්‍රදේශය බෙහෙවින් අවදානම් තත්ත්වයකට මුහුණ දුන් බවත්, එහිදී පන්සලේ පැතිබැම්ම කඩා ගිය බවත්, එහි පස් ඉවත්කර මාර්ගය පිළිසකර කර ගැනීමට සභාවක් හැටියට සභාපතිතුමා මැදිහත් වූ බවත් එයට බෙහෙවින් ස්තූතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.
අංක 12 වන යෝජනාව මොළගොඩ පල්පාත කන්දපාර නාය ගිය ස්ථානයේ පස් ඉවත් කිරීමට අප සභාවේ බැකෝ යන්ත්‍රයක් යෙදුවේද යන්න විමසන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

අංක 12 වන යෝජනාවෙහි අදාළ මාර්ගයේ නම වැරදි ඇති බවත්, එය සභාපතිතුමන්ට දැන් වූ බවත්, එය මොලගොඩ පාල්පාත රඹුක්පොත වත්ත පාර ලෙස නිවැරදි විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අංක 12 වන යෝජනාවට අදාළ බිල්පත් සභාවට ඉදිරිපත් කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

සභාපතිතුමන් විසින් ඉදිරිපත් කළ බිල්පත් නිවැරදි බවත්, ඒ අනුව අංක 12 වන යෝජනාවෙහි නම මොළගොඩ පල්පාත රඹුක්පොත වත්ත ලෙස නිවැරදි විය යුතු බවත් නැවතත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.ටී.එන්.ප්‍රසන්න මැතිතුමා**

අංක 16 වන යෝජනාවේ කාණු පද්ධතිය සකස් කිරීම ලෙස සඳහන් වුවද කාණු පද්ධතිය සකස් කර නොමැති බව ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

අංක 16 වන යෝජනාවේ සිංහාගොඩ පාරෙහි නාය ගිය ස්ථානයේ පැවැති පස් ඉවත් කිරීම ලෙස නිවැරදි විය යුතු බවත්, එහි කාණු පද්ධතියක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.ටී.එන්.ප්‍රසන්න මැතිතුමා**

අංක 22 වෙනි යෝජනාවෙහි පස් හා ගස් ඉවත් කිරීම මහජනතාව මැදිහත් වී සිදු කළ බවත්, ඒ සඳහා පුද්ගලික J.C.B යන්ත්‍රයක් යොදාගත් බවත්, ඒ නිසා එම මුදල ඔවුන් හට ලබා දෙනවාද යන්න ප්‍රශ්න කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

එම J.C.B යන්ත්‍රය හිමි පුද්ගලයා විසින් එම පස් ඉවත් කිරීමට අදාළ මුදල් ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති බවත්, ඔවුනට එම මුදල් ගෙවීමට අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අංක 02 සිට අංක 31 දක්වා වූ යෝජනා සභාවට ඉදිරිපත් කරන ලද අතර එම යෝජනා ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

අංක දෙක කෙහෙල්වතුගොඩ වසමට අයත් රණවන මාර්ගය ඉඹුල්ගස්දෙණියට අයිති මාර්ගයක් බව ප්‍රකාශ කරන ලදී. අංක 06 නාමල්ගමුව මාර්ගයේ පස් ඉවත් කිරීමට ගතවූ කාලය නිවැරදි දැයි ප්‍රශ්න කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගත වී ඇති කාලය නිවැරදි බවත්, එම යන්ත්‍රය පැවති ස්ථානයේ සිට ගමන ආරම්භයේ පටන් පැය ගණන ගණනය කර ඇති බවත්, ගත වූ කාලයට ආදාළ මීටරයේ ඡායා රූපයක් මෙහි ඇතුලත් බවත්, ගත වූ කාලය නිවැරදි බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

අංක 10 ඊරියගොල්ල සඳගිරි විහාර මාවත පස් ඉවත් කිරීම සම්බන්ධ යෝජනාව ගැන අවධානය යොමු කරන බවත්, එහිදී විශාල ගලක් එම මාර්ගය මත තිබුණ බවත්, කෙමිකල් යොදා එම ගල ඉවත් කිරීමට කටයුතු කළ බවත්, එම කෙමිකල් දමන මහත්වරුන් පහළ කඩුගන්නාවේ වැඩ කටයුතු සිදුකරන බැවින් සෑම දිනකම එම ගලට කෙමිකල් යෙදීමට නොපැමිණෙන බවත්, තවත් කොටසක් ඉවත් කිරීමට පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සෙන්ට්‍රල් ෆැන් මයිනස් ආයතනය එම ගල ඉවත් කර දෙන බවට පොරොන්දු වී ඇති අතර ඒ සඳහා මුදල් අවශ්‍යය නොවන බවත් දැන් වූ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

කුඹල්ඔලුව ප්‍රදේශයේ වෙළමැදින් ගමන් ගන්නා මාර්ගයේ පිළිසකර කළ කොටසේ ඉහළ කොටසින් ගලා එන ජල මාර්ගය නිසා මහජනතාවට මාර්ගය භාවිතා කිරීම අපහසු බව (වාහන ගමනාගමනය සිදු කළ හැකි වුවද) නිසා නව කාණුවක් කැපීමට ස්කැවේටර් යන්ත්‍රය හෝ කුලියට යන්ත්‍රයක් ලබා ගැනීමට අවස්ථාවක් ලබා දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නිරවද්‍ය හා සාධාරණ තොරතුරු මෙම ගොනුවේ පවතින බවත්, ගැටලු නොමැති නම් ගෙවීම් අනුමැතිය සඳහා ඔබතුමන්ලාගේ එකඟතාවය ලබාදෙන මෙන් ඉල්ලා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

සියලුම යෝජනා හා වාද විවාද ආසා සිටි බවත්, පක්ෂ, පාට, ජාති, ආගම් පංගු බේදයකින් තොරව ව්‍යසනකාරී අවස්ථාවකදී කටයුතු කළ යුතු බවත්, තමා මන්ත්‍රීවරයකු ලෙස නොතකා කළ හැකි උපරිමයෙන් මහජනතාව වෙනුවෙන් ලාභ සත්කාර බලාපොරොත්තුවකින් තොරව තම ශ්‍රමය හා ධනය වැය කළ බවත් ප්‍රකාශ කරන ලදී.
තවද සභාව සතු මහජන මුදල් මා සිදු කළ කිසිදු පිළිසකර කිරීම් කටයුත්තක් සඳහා යොදා නොගත් බවත්, මාගේ කීර්ති නාමයට පසුකාලීනව හානි විය හැකි බැවින් සභාවට මෙම ප්‍රකාශය ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පෙර පැවැති මහ සභා අවස්ථාවේදී ද මෙම සභා වාරයේදී ද නන්දික බණ්ඩාරනායක මැතිතුමාගේ සේවය අගය කළ බවත්, නැවතත් එතුමා දැක්වූ සහයෝගයට හිස නමා ආචාර කරන බවත්, අනෙකුත් මන්ත්‍රීතුමන්ලාට හා තුමියන්ලාට ඔහුව ආදර්ශයට ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී. තවද මෙම ව්‍යසනකාරී තත්ත්වය හේතුවෙන් සිදුකිරීමට නොහැකි වූ කිසියම් හෝ කාර්යයක් පවතී නම් අද හෙටම හැකි ඉක්මනින් එම යෝජනාව භාරදෙන ලෙස දන්වා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

ගංගොඩ සමගි මාවතට පොල් ගසක් කඩා වැටීම හා නාය යෑමක් සිදු වී ඇති බවත්, එම නිසා මාර්ගය භාවිතයට ගැනිම අපහසු බවත්, හැකි ඉක්මනින් එය පිළිසකර කර ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එය ඉටු කිරීමට ප්‍රමාද වුයේ මේ දින වල බැකෝ යන්ත්‍රය කාර්ය බහුල බැවින් බවත්, මේ දින කිහිපය තුළ එය සිදුකර දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මෙම යෝජනා ඉදිරිපත් කිරීමට ප්‍රථම ජනාධිපති අණ පරිදි ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරුන් වන අපවද දැනුවත් කර තිබුණා නම් මෙසේ මෙම යෝජනා වලට විරුද්ධව කතා නොකරන බවත්, අදහස් ප්‍රකාශ කිරීම සභාගර්භයෙන් ඉවත් කිරීමට තරම් බරපතළ කරුණක් ද යන්න විමසන ලදී. තවද නොකරපු පිළිසකර කිරීම් වලටද මුදල් වෙන්කර පවතින බව මෙම විවාද අනුව වැටහෙන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

තෙන්නකෝන් මන්ත්‍රීතුමා සභාපති හැටියට තමාට විශාල මඩ ප්‍රහාරයක් එල්ල කළ බවද අදාළ පිළිසකර කිරීම් සම්බන්ධව සොයා බලා තමාට කළ එම චෝදනාව සම්බන්ධව කිසියම් හෝ තොරතුරක් ලබාදෙන ලෙස අභියෝග කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

අදාළ අභියෝගය භාරගන්නා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ආදාළ පිළිසකර කිරීම් සම්බන්ධව වැය වූ මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම සම්බන්ධව විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ඇස්තමේන්තු හා බිල්පත් අනුමත කිරිමට තීරණය විය.

02. 2025.09.02 දින පැවති මහ සභා යෝජනා අංක ඊ.II.10 පසුවට සලකා බැලිම සඳහා කල්දැමූ යෝජනාව නැවත සාකච්ඡාවට ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

1.පොදු වෙළඳපළ තුළ පිහිටි අංක 33 ගව මස් කඩ කාමරය
2.පොදු වෙළඳපළ තුළ පිහිටි අංක 38 කුකුළු මස් කඩ කාමරය
3.පොදු වෙළඳපළ තුළ පිහිටි අංක 36 මාළු කඩ කාමරය
4.පොදු වෙළඳපළ තුළ පිහිටි අංක 31 කුකුළු කඩ කාමරය
5.පොදු වෙළඳපළ තුළ පිහිටි අංක 32 එළු කඩ කාමරය
6.පොදු වෙළඳපළ තුළ පිහිටි අංක 34 එළු කඩ කාමරය

යන කඩ කාමර අවස්ථා තුනකදී ටෙන්ඩර් කළ ද එම කඩ කාමර සඳහා කිසිදු ගැනුම්කරුවකු ඉදිරිපත් නොවූ බැවින් ටෙන්ඩර් කිරීමට නොහැකි වූ බව පවසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මස්කඩ කීහිපවතාවක්ම ටෙන්ඩර් වෙලා නොමැති බවත්, එයට ප්‍රධානතම හේතුව ලෙස බලපත්‍ර ලබාගත් පුද්ගලයින් නගරය ආසන්නයේ වෙනම කඩ ආරම්භ කර තිබීම ලෙස දැක්විය හැකි බවත්, ගවමස් කඩ සභාවක් යටතේ පැවතිය යුතු බවත්, සභා ආදායමක් අහිමි වී ඇති බවත්, මීට පෙර සභා වාර කීපයකදීම මේ ගැන දැනුවත් කළ බවත්, ඒ සම්බන්ධව පළාත් සභාවත් සමඟ සාකච්ඡා කර එම ආදායම සභාවට නැවත ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම් සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

මෙම කඩකාමර ටෙන්ඩර් කළේ මස් කඩ ලෙසද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගව මස් කඩ 02, මාළු කඩ 01, කුකුළු මස් කඩ 02, එළු මස් කඩ 01 ලෙස පවසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

මෙම කඩකාමර ටෙන්ඩර්කරුවන් ලබා නොගන්නා නිසා සංශෝධනයක් ඉදිරිපත් කරන ලදී. එනම් ආයුරුවේද වෛද්‍යවරියට අදාළ ආයුර්වේද බෙහෙත් බඩු ගබඩා කර තබා ගැනීමට හා රෝගීන් පරීක්ෂා කිරීමට මෙහි පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොමැති බැවින් හා වැසිකිලි පහසුකම් ද නොමැති බැවින් එම ආයුර්වේද මධ්‍යස්ථානය තාවකාලිකව ප්‍රතිස්ථාපනය කිරීමට එහි කඩකාමර දෙකක් එකට එක්කර ලබාදීම සුදුසු බව යෝජනා කරන ලදී. තවද ටෙන්ඩර්කරු එම කඩ භාවිතයට ගන්නේ නැතිනම් සභාවට ආදායමක් අහිමිවන බැවින් නැවත වෙනත් ක්‍රියාපටිපාටියකට යාම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සෝගාතකාගාරය සම්බන්ධව යෝජනාවක් සභාවට ඉදිරිපත් කළ බවත්, එමගින් ආදායම් උත්පාදනය කරගත හැකි බවත්, මුස්ලිම් ජනතාවට එය බාධාවක් විය නොහැකි බවත්, මාළු කඩ දෙක වෙළද මධ්‍යස්ථානයෙන් පිට තිබියදීම ඇතුළත මාළු කඩ දෙකක් සඳහා ටෙන්ඩර් කැඳවනවාද යන්න විමසන ලද අතර වෙළඳ මධ්‍යස්ථානය ඇතුළතට ප්‍රවේශ වීම සඳහා ප්‍රවේශ මාර්ගයක් පවතින නිසාත්, එම කඩ දෙක ඇතුලට ගැනීම සුදුසු බවත්, ඔබතුමන්ලා ගනු ලබන තීන්දු තීරණ මන්ත්‍රීවරු හැටියට අප හටද දැනගැනීමට සලස්වන්නේ නම් වටිනා බවත්, එවිට අදාල වෙළඳ ප්‍රජාව දැනුවත් කළ හැකි බවත්, ගවමස් කඩ වසා ඇති බවත්, දිගටම එම කඩ වසා තබනවා ද නැද්ද යන්න පිළිබඳ අදාළ පුද්ගලයින් දැනුවත් කළ යුතු බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා**

ගව මස් කඩ සම්බන්ධව ප්‍රශ්න දෙකක් පවතින බවත්, එනම්

01. ගවයන්ගෙන් බෝවන රෝගයක් සම්බන්ධව මහජනතාව අතර කට කතාවක් පැතිරී ඇති බවත්,
02. සභාවක් හැටියට මස්කඩ වලින් අය කරගනු ලබන මුදල විශාල වීමත් දැක්විය හැක.

විශේෂයෙන්ම කිසිදු පහසුකමක්වත්(ජලය, විදුලිය)නොමැති එම කඩ වලින් එලෙස විශාල මුදලක් අය කිරීම සුදුසු නොමැති බවත්, සභාවක් හැටියට අපි මැදිහත් වී එම පහසුකම් සපයා දී මුළුගැන්වී ඇති එම

කඩකාමර මහජනයා වෙත ඉදිරිපත් කිරීමට වැඩපිළිවෙළක් ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී. තවද මාළු කඩ දෙක ද අද සභාව යටතේ පවතින්නේ එම කඩ දෙක ප්‍රධාන මාර්ගයට මුහුණලා දැන් පවතින ස්ථානයේ පවතින බැවින් බවත් එසේ නොමැති නම් එම මාළු කඩ ආදායමද සභාවට අහිමිවීමේ අවධානමක් පැවති බවත් ප්‍රකාශ කරන ලදී. සභාවක් හැටියට මැදිහත් වී ගව මස්, කුකුල් මස් හා මාළු වල මිල සම්බන්ධව සාධාරණ මිලක් නියම කර එම කඩකාමර ටෙන්ඩර් කිරීමකට යාම සුදුසු බවත්, එමඟින් පාරිභෝගික ආකර්ෂණය දිනා ගැනීමට හා සභා ආදායම ඉහළ නංවා ගැනීමටද හැකියාව පවතින බව ප්‍රකාශ කරන ලදී. සභාවක් හැටියට කිසිදු ඉදිරි ක්‍රියාමාර්ග නොමැතිව බාහිර පුද්ගලයින් විසින් පවත්වාගෙන ගිය ගව මස් කඩ වසා තැබීම සුදුසු නොමැති බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

මෙම කඩකාමර කීහිපය සම්බන්ධව අදාළ වෙළඳ ප්‍රජාව සමඟ සාකච්ඡා කළ බවත්, ඔවුන්ගේ අදහස් අනුව වෙළඳ මධ්‍යස්ථානයේ ඉදිරිපස කොටසෙහි ගබඩාවක් ලෙස පවත්වාගෙන යනු ලබන කඩකාමර පිටුපස කොටසට යොමු කර එම ඉදිරිපස කඩ කාමර වෙළඳ කටයුතු සඳහා විවෘත කිරීම සුදුසු බව හා කඩකාමර වසා තිබියදී මහජනතාව වෙළඳ මධ්‍යස්ථානය පාළු ස්වභාවයක් නිසා නොපැමිණෙන බවත් ඔවුන්ගේ අදහස් බවත් ප්‍රකාශ කරන ලදී. තවද දොරවල් නොමැති කඩකාමර සඳහා දොරවල් සවිකිරීම සුදුසු බවත්, ඉන් අනතුරුව එම කඩ කුලියට හෝ ටෙන්ඩර් කර ගබඩා ලෙස දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.විශේෂයෙන්ම අඩි 10*10 කඩ කාමරයක මස් හෝ මාළු කඩයක් පවත්වාගෙන යාම ප්‍රායෝගිකව ගැටලු සහගත බවත්, ජල පහසුකම නොමැති වීමද ගැටලුවක් බවත් ප්‍රකාශ කරන ලදී. පසුගිය පැවැති රජය කාලයේදී නව මාළු කඩ දෙකක් ප්‍රධාන මාර්ගය ඉදිරිපස ඉදිකළ බවත්, එහි දෛනිකව සේවකයින් 04,05 දෙනෙක් සේවය කරන බවත්, තවදුරටත් ප්‍රකාශ කරන ලදී. නව මාර්කට් එකක් නිර්මාණය කරන තෙක් පවතින මාර්කට් එකේ මස් කඩ හා මාළු කඩ ලෙස ටෙන්ඩර් වී ඇති කඩ සාමාන්‍ය කඩ ලෙස පිළිසකර ගබඩා ලෙස හෝ භාවිතයට ගැනීමට කටයුතු සිදුකිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සංජීව මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් කාරක කමිටුව හා නවකමිටු සාමාජිකයින් ලෙස තෙන්නකෝන් මන්ත්‍රීතුමා, රුක්මන් මන්ත්‍රීතුමා, අනීස් මන්ත්‍රීතුමාත් ස්වේච්ඡාවෙන් කවර හෝ මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් වන්නේ නම් ඉදිරිපත් වන ලෙසත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව උපසභාපතිතුමා, නන්දික බණ්ඩාරනායක මන්ත්‍රීතුමාත් ඉදිරිපත් වූ බව ප්‍රකාශ කරන ලදී. තවද දෙසැම්බර් 29 හෝ 30 වන දින විශේෂ සභාවක් කැඳවන බවත් එදිනට අදාළ කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලෙසත් දන්වන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

වහලවල් තෙමෙන බැවින් එයට කුමක් හෝ පිළියමක් සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභාවක් හැටියට අපට පුළුවන් විදියට එම කඩකාමර පිළිසකර කිරීම් සිදුකළ බවත්, පළාත් සභා ඉංජිනේරු මහතාගේ මැදිහත් වීමෙන් එතුමන්ගේ උපදෙස් මත ස්ලැබ් එකෙහි වතුර වැස්සෙන තැන් ටික ටික පිළිසකර කිරීම් සිදුකිරීමට වෙළෙඳ මහතුන් සමඟ එකඟතාවයකට පැමිණ ඇති බවත් ප්‍රකාශ කරන ලදී. තවද අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

2025.12.17 වන දින කමිටුව රැස්වෙමුයි යෝජනා කරන ලදී.

අදාළ යෝජනාව දිගුවකට යටත්ව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
කමිටුවක් පත් කළ අතර එම කමිටු වාර්තාව 2025.12.30 දින විශේෂ මහ සභාවට ඉදිරිපත් කළ යුතු බවත්, ඒ අනුව කටයුතු කරන බවට තීරණය විය.

03. මෙම සභාව සතු නව පළමු වෙළඳ සංකීර්ණය බිම් මහලෙහි මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි කාර්යාලය පිහිටි කාමරය සඳහා දීර්ඝ කාලයක් තිස්සේ කිසිදු ගෙවීමක් සිදු නොවූ අතර ඒ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් වාර්තාව ලබා ගැනිමට කටයුතු කළ අතර 2025.02.28 දින එම තක්සේරු වාර්තාව අප වෙත ලැබිණි. එහෙයින් එම ආයතනය සමඟ ගිවිසුම් ගතව නව තක්සේරුව ක්‍රියාත්මක කිරිමට හා ක්‍රියාත්මක කරනුයේ කවරදා සිටද යන්න තීරණය කිරීමට මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

2026 ජනවාරි මස සිට ක්‍රියාත්කම කිරීමත්, ඒ සඳහා ලිපිගොනුවක් පවත්වාගෙන යාමත් සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2026 ජනවාරි මස සිට ක්‍රියාත්කම කිරීමට තීරණය විය.

**අවසානය**

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්, ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්,මාධ්‍ය වේදීන්ටත් ස්තුතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු පෙ.ව 11.00 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.